# 1.10 නූතන නාට්‍ය කලාව තුළ ප්‍රේක්ෂකයා හා බැඳෙන ගැටලු

තුමිඳු දොඩන්තැන්න
නාට්‍ය හා රංග කලා සහ ප්‍රතිබිම්බ කලා අධ්‍යයන ඒකකය, කැලණිය විශ්වවිද්‍යාලය

## ABSTRACT

ප්‍රේක්ෂකයා නැති තැන නාට්‍යයක් නැත. එසේනම් සෑම විටම නාට්‍යයක් නිර්මාණය වීම උදෙසා ප්‍රේක්ෂකයෙකු සිටිය යුතුමය. ඔහු කවරෙක් ද?. ලෝකයේ එතෙක් මෙතෙක් බිහිවුණු නාට්‍ය සම්ප්‍රදායන් තුළ දී නොයෙකුත් ප්‍රේක්ෂාගාර ඉලක්ක කරගත් නාට්‍ය දක්නට ලැබුණි. එහි දී ප්‍රේක්ෂකයා සම්බන්ධ වන්නේ නාට්‍ය සමග ද, නැත්නම් ඔවුන් ඉලක්ක කොටගත් සමාජ, දේශපාලන, හෝ සංස්කෘතිමය ගැටලු සමග ද, එසේ වූ විට වෙනත් ප්‍රේක්ෂක කණ්ඩායමකට ඉහත නාට්‍ය ඉලක්ක නොවන්නේ නම් ඔවුන් නාට්‍ය රසවිඳින්නේ කෙසේ ද?. ප්‍රේක්ෂකයා සහ නාට්‍ය අතර බද්ධ වීම යනු හැඟීම් සහ භාවයන් අතර සිදුවන ගණුදෙනුවක් ද?. එසේනම් එවන් භාවාත්මක අත්දැකීම් විරහිත ප්‍රේක්ෂකයා නාට්‍යයේ රසිකයෙකු නොවන්නේ ද?.

- රසිකයා තම රසිකත්වය වර්ධනය කරගත යුතු ය.
- නළුවා රසිකයාගේ මනස අවබෝධ කොටගත යුතු ය.

නළුවා සහ රසිකයා අතර ඇතිවන බැඳීම වර්ධනය වන්නේ ඉහත කරුණු සම්පූර්ණ වූ විටය.

නළුවා සහ රසිකයා පිළිබඳව තවත් පැති මානයන් කිහිපයක් ඔස්සේ විමසා බැලිය හැකි ය. නළුවෙකු නළුවෙකු බවට පත්වන්නේ නාට්‍යයේ දී පමණ ද?. නොඑසේනම් වේදිකාවක් මතට නැගුණ විට පමණ ද?. ප්‍රේක්ෂකයා ප්‍රේක්ෂකයෙකු වන්නේ ප්‍රේක්ෂාගාරයක සිටින විට පමණ ද?.

සිඟන්නෙකු නළුවෙකි. ඔහු කරන්නේ රංගනයකි. ඔහු තමාව අලෙවි කිරීම උදෙසා විවිධ උපක්‍රම භාවිත කරයි. අපට මහමග දී හමුවන බොහෝ මිනිස්සු නළුවෝ ය. එවන් විටෙක අප ප්‍රේක්ෂකයා බවට පත්වෙයි. එසේ නම් නාට්‍යක ප්‍රේක්ෂකයා නිශ්චිත එක් තැනක සිටින්නෙක් නොවේ. ඔහු බොහෝ තැන්වල සිටිය හැකිය. එක් මොහොතකට නළුවකු හා ප්‍රේක්ෂකයෙකු අතර භාවාත්මක හුවමාරුවක් සිදුවෙයි. නාට්‍ය නම් මෙයයි. ඒ නාට්‍යයට නමක් නැත. රඟහලක් නැත. එහෙත් නාට්‍යයක් ඇත. හේතුව ප්‍රේක්ෂකයෙක් සහ නළුවෙක් සිටින බැවිනි. එසේ නම් ප්‍රේක්ෂකයෙක් සහ නළුවෙක් ඇති තැන නාට්‍ය බිහි වෙයි.
"ලෝකය රඟමඩලකි. අපි එහි රඟන නළුවන් වෙමු".

ෂේක්ස්පියර් නම් මහා නාට්‍යවේදියාගේ ඉහත ප්‍රකාශය වේදිකාවකට පමණක් සීමා වූවක් නොවේ. එය සමස්ත ලෝකයේ ම පැවැත්මට පොදු වූවකි.